ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2007

අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම - **ESP** 2312

කාලය පැය තුනයි.

---

දිනය - 2007.07.08 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. **(i)** අධ්‍යාපනය තුළින් පුද්ගලයාට හා සමාජයට ඉටුවිය යුතු යැයි අපේක්ෂා කෙරෙන කාර්යයන් කෙටියෙන් දක්වන්න.

**(ii)** 'ශ්‍රම වෙළඳ පොළේ ඉල්ලුම හා අධ්‍යාපන පද්ධතියේ නිමැවුම් අතර ඇති නොගැලපීම ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ගැටළුවකි.' ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(iii)** මානව සංවර්ධන න්‍යාය සැලකිල්ලට ගනිමින් ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය නැංවීමට අධ්‍යාපනයට ඉටුකළ හැකි භූමිකාව විභාග කරන්න. (ලකුණු 11 x 3 = 33)

02. **(i)** සංස්කෘතිය හා සමාජානුයෝගය අතර පවතින සම්බන්ධය අදාළ නිදසුන් දක්වමින් විස්තර කරන්න.

**(ii)** 'පවුල් අතර දක්නට ඇති සංස්කෘතික විවිධත්වය හා පාසල් සමවිය සංස්කෘතිය ළමුන්ගේ සමාජානුයෝගය කෙරෙහි දැඩි බලපෑමක් සිදු කරයි.'
මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

**(iii)** ශ්‍රී ලංකාවේ පාසල් විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් පාසල් සංස්කෘතීන් හා පාසල් උප- සංස්කෘතීන් විවිධ වූ ළමුන්ට විවිධ ප්‍රතිඵල ලබා දෙන ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 11 x 3 = 33)

03. (i) 'සමාජ ස්ථරායනය' හා ' සමාජ සචලතාව' නිර්වචනය කරන්න.

(ලකුණු 09)

(ii) පහත දැක්වෙන අංශ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ සමාජ සචලතාව කෙරෙහි අධ්‍යාපනය ඉටු කරන භූමිකාව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(අ) අධ්‍යාපනයට ප්‍රවේශය
(ආ) අධ්‍යාපනයෙහි සහභාගිත්වය
(ඇ) විභාගයන්හි සාධනය
(ඈ) උගත් තරුණ පිරිසේ සේවාදායකත්වය

(ලකුණු 24)

04. (i) 'අගයන්' පිළිබඳ සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 06)

(ii) අධ්‍යාපනය වෙතින් අගයන් වෙන් කළ නොහැකි මන්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(iii) පාසල් පරිසරයේදී සිසුන් තුළ අගයන් ප්‍රගුණ කරවීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විභාග කරන්න.

(ලකුණු 15)

05. 'ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය යනු වෘත්තීය වර්ධනය හා සංවර්ධනය ඉහළ නැංවීමට නිරන්තර අවස්ථා හා අත්දැකීම් ක්‍රමානුකූල ලෙස සැලසුම් කර ඉදිරිපත් කරන දිගුකාලීන ක්‍රියාවලියකි.'

(i) ගුරුභවතුන්ට ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ලබා දිය හැකි අත්දැකීම් වර්ග හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ii) ගුරුභවතුන්ගේ වෘත්තීය සංවර්ධනය සිසුන්ගේ ඉගෙනුම කෙරෙහි බලපෑමක් සිදු කරයි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iii) ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය රටක ක්‍රියාත්මක කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සාර්ථකත්වය කෙරෙහි බලපෑමක් කරයිද? ශ්‍රී ලංකාව විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 11 x 3 = 33)

06. (i) වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පාසල්වල ද්විතියික අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන උග්‍රතම ගැටළු තුන වශයෙන් ඔබ සලකන්නේ මොනවාද ?

(ii) මෙම ගැටළු ඇතිවීම කෙරෙහි බලපා ඇති සාධක විශ්ලේෂණය කරන්න.

(iii) ඔබ ඉහත හඳුනාගත් ගැටළු විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 11 x 3 = 33)

07. පහත දැක්වෙන ප්‍රකාශ දෙකක් පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(i) 'සන්දර්භානුගත (contextual) අවස්ථා තුළින් මතුවන අභියෝග වටහා ගනිමින් ඒවා කළමනාකරණයට අවස්ථා ගුරු අධ්‍යාපනය තුළින් ගුරුභවතුන්ට ලබා දිය යුතුය.'

(ii) අධ්‍යාපනය කෙරෙහි යොදවන ආයෝජන සංවර්ධනය කෙරෙහි යොදවන ආයෝජන වේ.

(ii) ජාත්‍යන්තරකරණය දියුණු වෙමින් පවතින රටවල අධ්‍යාපනය කෙරෙහි මිශ්‍ර ප්‍රතිඵල ලබා දී ඇත. මිශ්‍ර ප්‍රතිඵල යනුවෙන් අදහස් වන්නේ වාසිදායක හා අවාසිදායක තත්ත්වයන්ය.

(iv) ශ්‍රී ලංකාවේ පාසල් වල අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය නැංවීම උදෙසා තොරතුරු තාක්ෂණය අත්‍යවශ්‍ය සංරචකයක් ලෙස සැලකිල්ලට ගනු ලබයි.

(v) සැමට අධ්‍යාපනය ඉටු කර ගැනීමට ඇති දුෂ්කරතා ජය ගැනීමට 'විවෘත ඉගෙනුම' යොදා ගත හැකිය.

(ලකුණු 16 x 2 +1 = 33)

\- හිමිකම් ඇවිරිණි. -